# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2018 ජනවාරි මස 09 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා. 09.37 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු හෙක්ටර් බෙත්මගේ | (සභා නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්වන්ද්‍ර ද සිල්වා
අනුරුද්ධ ලේකම්ගේ
අශෝක දයාරත්න
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මැතිනිය
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්
ගුණසිරි ජයනාත්
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
ප්‍රදීප් පෙරේරා
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොරිස් විජේරත්න
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සරත් පතිරණ
සහන් ප්‍රදීප්
සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා
සුනිල් ජයමිණි
සුමිත් විජයමුණි ද සොයිසා
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
ශිරන්ත අමරසේකර
හරිස්චන්ද්‍ර කොස්තා

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු චන්දන ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අසෝක රන්වල
අමල් සිල්වා
ඇ. ශ්‍රීනාත් ම. පෙරේරා
උදාර රත්නායක
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කේ.ඩී. අරුණ දීපාල්
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ජගත් අංගගේ
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිරෝෂා අතුකෝරල මැතිනිය
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
මල්ෂා කුමාරණතුංග මැතිනිය
රජිත හපුආරච්චිගේ
රන්දීර් රොද්‍රිගෝ
රොජර් සෙනෙවිරත්න
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සලෝචන ගමගේ
සුනිල් වටගල
සෙනල් වෙල්ගම
ශ්‍රීනාත් පෙරේරා

**01. අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා දීම්/දිවුරුම් දීම් : ගරු ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම්**

*"යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා 2017.12.19 දින සිට මෙම පළාත් සභාවෙන් ඉල්ලා අස්වීමෙන් ඇති වූ මන්ත්‍රී ධූර පුරප්පාඩුව සඳහා ගරු ක්‍රිෂාන්ත යෝගදාස් පංචරත්නම් රාම් මැතිතුමා බස්නාහිර පළාතේ පළාත් සභාවේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස තේරී පත් වූ අතර 2018.01.08 දින තමන් ඉදිරියේ නිල ප්‍රතිඥාව/දිවුරුම දීමද සිදු කරනු ලැබූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. සභාපතිවරයාගේ නිවේදන :

*මන්ත්‍රීවරුන්ගේ ඉල්ලා අස්වීම :*

*"එම්.ඒ. මංජුල ප්‍රසන්න සම්පත් [2017.12.13 දින සිට], ජේ.ඒ. රොයිස් විජිත ප්‍රනාන්දු [2017.12.18 දින සිට], එස්. කුහවර්දන් [2017.12.15 දින සිට] හා යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා [2017.12.19 දින සිට] ගරු මන්ත්‍රීතුමන්ලා ඉල්ලා අස්වීම නිසා මෙම පළාත් සභාවේ මන්ත්‍රී ධූර පුරප්පාඩු වූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.*

## 03. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් 2017.12.20 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා වාර්තාව හා 2017.11.22 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගන්වන ලදී.

අනතුරුව, යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් [කාරක සභාවේ සභාපති වෙනුවෙන්] 2017.12.07 දින පැවති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගන්වන ලදී.

***පූ.භා.10.43 ට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබද ප්‍රශ්නය නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැදවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.
පසුව, ගණපූරණය ඇති විය.***

***පූ.භා.10.47 ට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගණපූරණය පිළිබද ප්‍රශ්නය යළිත් නගන ලදුව, එවලේ සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන්, කැදවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.
පසුව, ගණපූරණය ඇති විය.***

## 04. බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති :

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*ගරු සභාපතිතුමනි, " 2017.11.07 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට පිළිගන්වන ලද බස්නාහිර පළාතේ පළාත් සභාවේ නව කාර්ය පටිපාටි රීති පුස්තක කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කර අනුමත කළ යුතුය."* යන යෝජනාවට අනුව,

කාර්ය පටිපාටි රීති සංශෝධන පුස්තකයේ රීති අංක 13 පිළිබඳ කටයුතු එදින අසම්පූර්ණව පවත්නා බැවින්, ඒ පිළිබඳ යළිත් අද දින සභාවේ එකඟතාව විමසන බව ගරු සභාපතිතුමා යෝජනා කරනු ලදුව,

*ප්‍රශ්නය විමසන ලදීන්, පක්ෂව 35 යි, විපක්ෂව 04 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.*

***පූ.භා. 11.07 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කොරළගේ මහතා] මූලාසනාරූඪ විය.***

## 05. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"බස්නාහිර පළාතේ කොළඹ හා කළුතර යන දිස්ත්‍රික්ක 02 ට අයත් ප්‍රදේශයක පිහිටා ඇති බොල්ගොඩ ගඟ ලෙසත් වැව ලෙසත් හඳුනන තෙත් බිම් පද්ධතිය පළාතේ සංවර්ධනයට යොදා ගත හැකි වටිනා සම්පතකි. ආර්ථික හා පාරිසරික වටිනාකමක් ඇති මෙම තෙත් බිම් පද්ධතිය වර්තමානය වන විට නොයෙක් විනාශයන්ට ගොදුරු වූ මානව සංවර්ධනයට සම්බන්ධ නොවන කිසිදු පරිපාලන ආයතනයක සෘජු සංවර්ධනයකට දායක නොවුනු අත්හැර දමන ලද සම්පතක් බවට පත් වී ඇත. මිරිදිය ධීවර කර්මාන්තය, පළාත් සංචාරක ව්‍යාපාරය, භාණ්ඩ ප්‍රවාහනය, තෙත් බිම් ආශ්‍රිත ඖෂධීය හා කෘෂි ආර්ථික තත්ත්වයන් පෝෂණය කර ගැනීම යනාදී වටිනා සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි මෙම පරිසර පද්ධතිය පිළිබඳව පුළුල් විද්‍යාත්මක සමීක්ෂණයකින් පසුව පරිපාලන ආයතන ඒකාබද්ධ කර ගත් බොල්ගොඩ තෙත් බිම් පද්ධතිය උදෙසා සංවර්ධන වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කර සිටියි"*

## 06. කල් තැබීමේ යෝජනාව :

එවලේ, සුමිත් ලාල් මැන්දිස් ගරු අමාත්‍යතුමා විසින් *"දැන් මෙම සභාව කල් තැබිය යුතු ය."* යන යෝජනාව ඉදිරිපත් කරනු ලදුව, ප්‍රශ්නය සභා සම්මත විය.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 12.08 ට, 2018 ජනවාරි මස 23 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2018.01.09
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

අච/09
Minuts 2018.01.09 - Hansard Section